නිපුණතාව 2.0 - ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 2.3 - ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.

- සුධාරකගේ ව්‍යාපාරයේ 2019/01/01 දිනට හා 2019/12/31 දිනට හිමිකම් හා හිමිකම වෙනස්වීමට බලපෑ ගනුදෙනු සමහරක් පහත දැක්වේ.

| | රු.000 |
|---|---|
| 2019/01/01 දිනට හිමිකම | 8,000 |
| 2019/1/31 දිනට හිමිකම | 10,000 |

- සුධාරක වසර තුළ මුදලින් රු.500,000ක් හා රු.200,000ක් වටිනා භාණ්ඩ නිවසේ ප්‍රයෝජනයට ගෙන ඇත.
- වසර තුළ සුධාරක රු.800,000 ක් වටිනා මෝටර් රථයක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යොදවා ඇත.

  අවශ්‍ය වන්නේ,

  1.ශුද්ධ වත්කම් ඇසුරෙන් සුධාරකගේ ව්‍යාපාරයේ 2019 වසරේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

  පහත සඳහන් පද සුදුසු තැන්හි යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

  (ගැලපුම් සංකල්පය,ආදායම් ප්‍රකාශනය,මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,ශුද්ධ වත්කම්,ලාභය/අලාභය)

  1.යම් නිශ්චිත කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ..................................පිළියෙල කරයි.
  2.යම් නිශ්චිත කාල සීමාවක ඉපයූ ලාභය හෝ අලාභය සෙවීමට ආදායම් ඉපයීමට අදාළ වියදම් සම්බන්ධ කර ගන්නේ ...........................................ට අනුවයි.
  3.ව්‍යාපාරයක යම් නිශ්චිත දිනකට වත්කම්,වගකීම් හා හිමිකම් දැක්වෙන ලේඛනය ...............................ලෙස හැඳින්වේ.
  4.ආදායම් ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ ව්‍යාපාරයක නිශ්චිත කාල සීමාවක් සඳහා ................................ගණනය කිරීමයි.
  5.ව්‍යාපාරයක හිමිකම ............................ලෙසද හඳුන්වනු ලැබේ.